WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

50 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

නාට්‍ය හා රංග කලාව I, II
நாடகமும் அரங்கியலும் I, II
Drama and Theatre I, II

## නාට්‍ය හා රංගකලාව II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** විකෘති නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (i) විකෘති නාට්‍යයේ ඇතුළත් දර්ශන සංඛ්‍යාව කීය ද? (ලකුණු 02 යි)
- (ii) මෙම නාට්‍යයේ කතාව ගලායන කාල සීමාව වසර කීය ද? (ලකුණු 02 යි)
- (iii) ප්‍රියංගනී දක්ෂතා දක්වන හැකියාවන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
- (iv) විකෘති නාට්‍යයේ දර්ශන සිදුවන ස්ථාන **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
- (v) අවසාන ජවනිකාවේ ඇතුළත් නිශ්චිත පුද්ගල නාම නැති චරිත **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
- (vi) විකෘති නාට්‍ය පෙළ රචනයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

**2.**
- (i) නාට්‍යමය ලක්ෂණ ඇති පහතරට ශාන්තිකර්ම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
- (ii) එම ශාන්තිකර්ම පවත්නා ප්‍රදේශ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
- (iii) ඉහත (i) හි සඳහන් කරන ලද ශාන්තිකර්මයක දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06 යි)

**3.**
- (i) රඟපෑම පුහුණු වීමේ දී නළු-නිළියන් විසින් ප්‍රගුණ කළ යුතු අංග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
- (ii) රූපණ ශිල්පියකුට අවශ්‍ය ගුණාංග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
- (iii) 'රූපණය' යනු කුමක් දැ යි ඔබ නැරඹූ නාට්‍යයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**4.**
- (i) අංගරචනයේ මූලික කොටස් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)
- (ii) අංගරචනා ශිල්පීන් භාවිත කරන අමුද්‍රව්‍ය **දෙකක්** සහ උපකරණ **දෙකක්** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)
- (iii) නාට්‍ය රඟ දැක්වීමේ දී අංගරචනය අවශ්‍ය වන්නේ ඇයි දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**5.**
- (i) සොකරි රඟ දැක්වෙන ප්‍රදේශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
- (ii) සොකරි නාට්‍යයේ ඇතුළත් වන ප්‍රධාන චරිත **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
- (iii) සොකරි නාටකයේ රංග ශෛලිය කරුණු **තුනක්** යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**6.**
- (i) හෙන්රි ජයසේන රංගනයෙන් දායක වූ වේදිකා නාට්‍යයක නම හා ඔහු රඟ පෑ චරිතය සඳහන් කරන්න. (ලකුණු 02 යි)
- (ii) හෙන්රි ජයසේන නිෂ්පාදනය කළ ස්වතන්ත්‍ර නාට්‍ය **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)
- (iii) හෙන්රි ජයසේන ගෙන් දේශීය නාට්‍ය කලාවට සිදු වූ සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06 යි)

**7.** පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කරගත හැකි ය.

චතුරි විද්‍යා විෂයන් ඉගෙනගැනීමට කැමති ය. ඇගේ බලාපොරොත්තුව අනාගතයේ වෛද්‍යවරියක වීම යි. චතුරි ගේ නංගි සෙනුරි සංගීතයට සහ නර්තනයට දක්ෂ ය. ඇගේ බලාපොරොත්තුව කලා අංශයෙන් ඉගෙනගෙන ගුරුවරියක වීම යි. තාත්තා සෙනුරිට විද්‍යා අංශයෙන් ඉගෙන ගන්නා ලෙස බල කරයි. අම්මා සෙනුරි ගේ කැමැත්තට පක්ෂ ව කතා කරයි.

- (i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)
- (ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04 යි)
- (iii) කුතුහලය සහ චරිතයක නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....